දෙවන කලාපය
ISSN - 1391-6785

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජුලි - දෙසැම්බර්

## සම්ප්‍රදායික දැනුමෙන්..

තේ තවානක මළු පුරවන්න සැලකිය යුතු මුදලක් සහ කාලයක් වැය වෙනව. අඩු කාලයකින් වැඩි තවාන් මළු ප්‍රමාණයක් පුරවගන්න හැකි නම් අඩු වියදමකින් තවානක් ආරම්භ කරන්න අපට පුළුවන්.

ඉංදියානු ගම්මාණ වල තවාන් මළු පිරවීම සඳහා භාවිතා කලේ යැ යි පැරණි පත පොත වල සඳහන් -කිටිනාල්- යනුවෙන් හැඳින්වෙන සරළ ක්‍රමය අනුසාරයෙන් තේ තවාන්වල මළු පිරවීම සඳහා ඉතාමත් සරළ ක්‍රමයක් ඔබට හඳුන්වා දීමට මා බලාපොරොත්තු වෙනව.



මේ සඳහා අවශ්‍ය වන්නේ ඔබ තවාන සඳහා යොදා ගැනීමට බලාපොරොත්තුවන පොලිතීන් මළු වල විශ්කම්බයට සමාන විශ්කම්බයක් සහිත, අඟල් 14 ක් පමන උස සිලින්ඩරයක් සාදා ගැනීමට තරම් ප්‍රමාණවත් සවිමත් GI තහඩු කැබැල්ලක්.

සාමාන්‍යයෙන් අප නිර්දේශ කරණ තවාන් මළුවල විස්කම්බය (මල්ල පස්වලින් පිරවූ පසු) වන්නේ අඟල් 4.5 ක් වන නිසා ඔබ විසින් සාදාගන්නා සිලින්ඩරයේ විස්කම්බය අඟල් 4 ක් පමන විය යුතු අතර සිලින්ඩරයේ එක් පැත්තක උල් හැඩයක් තිබිය යුතුය.



සාදාගන්නා සිලින්ඩරයේ උඩ කෙලවරේ විශ්කම්බය පහත කෙලවරේ විශ්කම්බයට වඩා අඟල් 1/2 ක් පමණ අඩුවෙන් සාදා ගැනීමෙන් පොලිතින් මල්ල සිලින්ඩරයට පිටින් යෙදීමට වඩා පහසුවේ.

දැන් ඔබ සාදාගත් සිලින්ඩරයේ ඉහල කෙලවරින් පොලිතින් මල්ල සිලින්ඩරයේ පිට පැත්තෙන් යොදා, පිලියෙල කරගත් පස් ගොඩ තුලට සිලින්ඩරය ඇතුළු කර පහසුවෙන් පොලිතින් මල්ල තුලට පස් පුරවා ගත හැක.

මෙහිදී එක් වතාවක දී පොලිතින් මල්ල තුලට පස් පුරවා ගෙන එම පස් තරමක් අතින් තදකර දෙවන වතාවේ දී ගන්නා පස් ටික නැවත අතින් තදකර ගන්න.



මෙම ක්‍රමයේ ගුණ අගුණ, වාසි අවාසි පිලිබඳ අප තවමත් අධ්‍යයනය කරන බැවින් මෙම ක්‍රමය තේ පර්යේෂණායතනය විසින් තවම නිර්දේශ කරන ක්‍රමයක් නොවෙයි. මේ ක්‍රමය කුඩා පරිමානයෙන් ඔබ ම අත්හදා බලන්න. ඔබ මෙහි දකින වාසි අවාසි පිළිබඳ ව අපට ලියා එවන්න. ඉදිරි කාලයේ දී මෙය පිළිබඳ තවත් තොරතුරු අප ඔබ වෙත ගෙන එන්නම්.

ධර්මප්‍රිය සමන්සිරි